ශීර්ෂය 166 - ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 166 - ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 11 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2022 හා 2023 වර්ෂ සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවලදී හඳුනාගත් පරිදි පිළිවෙළින් රු.1,341,918 ක් වූ භාණ්ඩ ඒකක 155 ක් හා රු.275,975 ක් වූ භාණ්ඩ ඒකක 119 ක් වෙන්දේසි කර හා අපහරණය කර තිබුණද එම වත්කම්වල පිරිවැය ස්ථාවර වත්කම්වලින් ඉවත්කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් රු.1,617,893 ක් වැඩියෙන් දක්වා තිබුණි.	මෙම වටිනාකම 2025 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තාවලින් නිවැරදි කිරීමට කටයුතු කරමි.	අපහරණය හා වෙන්දේසි කර තිබූ වත්කම්වල පිරිවැය ස්ථාවර වත්කම්වලින් ඉවත්කිරීම කළ යුතුය.
(ii)	වෙනත් රජයේ ආයතන නමින් ලියාපදිංචි කර තිබූ එහෙත් ආයතනය විසින් පාවිච්චි කරනු ලබන රු.46,030,000 ක් වූ වාහන 13 ක අයිතිය අමාත්‍යාංශයට පවරාගැනීමකින් තොරව අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර නොතිබූ පිරිවැය රු.10,200,000 ක් වූ වාහන 03 ක් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබාදී තිබුණද එම වටිනාකමද වත්කම්වලින් ඉවත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.	මෙම වාහනවල අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉල්ලීම් කර ඇතත් මෙතෙක් අනුමැතිය ලැබී නැත. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ වාහන 03 පැවරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂයේ යොමුකර තිබුණද අදාල තොරතුරු වාර්තා නොවීම හේතුවෙන් ස්ථාවර වත්කම්වලින් ඉවත් කිරීම සිදු නොකරන ලදි.	පෙර ලියාපදිංචිය ඇති ආයතනයේ එකඟතාවය මත එම වාහන ආයතනය නමින් ලියාපදිංචිකර ගැනීමට කටයුතු කළ යුතුය. අමාත්‍යාංශයට අයිතිය නොමැති වාහනවල පිරිවැය ස්ථාවර වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කල යුතුය.

(iii)	හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට රාජකාරී කටයුතු වෙනුවෙන් ලබා දී තිබූ රු.1,393,042 ක් වටිනා කැමරා උපකරණ, මුද්‍රණ යන්ත්‍රය හා ලැප්ටොප් පරිගණකය 2022 මැයි 09 දින රටේ පැවති අර්බුදකාරී තත්ත්වය මත විනාශ වී තිබූ බව ආරච්චිකට්ටුව පොලිස් ස්ථානාධිපති (වැ.බ), අමාත්‍යාංශය වෙත දන්වා තිබුණි. එසේ වුවද එම වත්කම්වල පිරිවැය මූල්‍ය නොවන වත්කම්වලින් ඉවත්කර නොතිබුණි. මෙම උපකරණ හදිසි තත්ත්වයක් මත සම්පූර්ණයෙන්ම විනාශ වීම, උපකරණ භාරව සිටි නිළධාරීන්ට පාලනය කළ හැකි සීමාවෙන් බැහැරව වූ සිදුවීමක් ලෙස 2023 මැයි 11 දින ඉදිරිපත් කර තිබූ මුදල් රෙගුලාසි 104 පරීක්ෂණ වාර්තාවෙහි දක්වා තිබුණි. අමාත්‍ය කාර්යාලයෙහි පරිහරණය සඳහා ලබාදී තිබූ මෙම උපකරණ අවසරයකින් තොරව අමාත්‍ය කාර්යාලයෙන් පිටතට රැගෙනයාම පිළිබඳව පරීක්ෂණ කමිටුවේ අවධානය යොමුවී නොතිබුණි.	මේ පිළිබඳව 2024.05.28 වන දින මහා භාණ්ඩාගාර ලේකම් වෙත මු.රෙ 104(4) යටතේ අලාභය පිළිබඳ අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරි ප්‍රගතිය විගණනය වෙත වාර්තා කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත.	විනාශ වූ වත්කම්වල පිරිවැය නිසි අනුමැතිය යටතේ ස්ථාවර වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු අතර වත්කම් විනාශ වීම තුලින් රජයට වූ පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ආ) අග්‍රිම ශේෂය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල ACA-3 ආකෘතියේ සඳහන් පරිදි වෙනත් මූලාශ්‍රවලින් ලැබීම් රු.361,635,417 ක් වුවද මාසික ගිණුම් සාරාංශ අනුව එම වටිනාකම රු.256,924,792 ක් වූයෙන් ඒ අතර රු.104,710,625 ක වෙනසක් විය.	සටහන් කිරීමේ දෝෂයකින් මෙය සිදු වී ඇත.	මූල්‍ය ප්‍රකාශන මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
(i) 1.6.1(අ)(i)	අපහරණය හා වෙන්දේසි කර තිබූ වත්කම්වල පිරිවැය ස්ථාවර වත්කම්වලින් ඉවත්කර නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතුය.	1.6.1(අ)(i)
(ii) 1.6.1(අ) (ii)සහ(iii)	නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා දී ඇති රු.10,200,000ක් වූ මෝටර් වාහන 03ක් සහ වෙනත් ආයතන නමින් ලියාපදිංචි කර තිබූ රු.46,030,000ක් වූ වාහන 13ක් ස්ථාවර වත්කම්වලින් ඉවත්කිරීමට කටයුතු කල යුතුය.	1.6.1(අ)(ii)
(iii) 1.6.1(අ)(iv)	විනාශ වූ උපකරණවල වටිනාකම පොත්වලින් ඉවත්කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා ඊට අදාලව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	1.6.1(අ)(iii)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුකූලව සකසුරුවම්කම සහ කාර්යක්ෂමතාව පිළිබඳ අවධානය යොමු නොකර ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයන් 30 ක සියයට 52 සිට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	අමාත්‍ය කාර්යාලයේ වියදම් වාරිමාර්ග අමාත්‍යාංශය මගින් දැරීම, වතු අංශයේ ගොඩනැගිලි අළුත්වැඩියා නොකිරීම, පරිගණක මෘදුකාංග නඩත්තුව සඳහා වියදම් නොවීම, අමාත්‍යාංශ නාමයන් වෙනස්වීම මත වියදම් සිදු නොවීම, ව්‍යාපෘතිවල බිල්පත් ඉදිරිපත් නොවීම, විදේශීය ණය මුදල්	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ප්‍රතිපාදන අවශ්‍යතාව නිශ්චිතව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙළ කිරීමට හා ඒ ඒ වැය විෂයන්ට වාර්ෂිකව ලබා දෙන ප්‍රතිපාදන අදාල අරමුණ කරා යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග

				නිදහස් කිරීම/ ප්‍රතිපූර්ණය කිරීම අත්හිටුවීම, ඉඩම් අත්පත් කරගැනීමේ දුෂ්කරතා වැනි හේතූන් නිසා ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුව තිබුණි.	ගතයුතුය.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104(4)		හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට අනුයුක්ත කර තිබූ ජීප් රථයට අනතුරක් සිදු වී 2025 ජනවාරි 20 දින වන විට වසරකට වැඩි කාලයක් ගත වී තිබුණද මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ සිදු කර නොතිබුණි.	මු.රෙ. 104(4) අවසන් වාර්තාව මහා භාණ්ඩාගාරය වෙත යැවීමට හා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අවශ්‍ය පරීක්ෂණ සිදු කර අනතුර හේතුවෙන් රජයට සිදුවූ පාඩු අදාල වගකිව යුතු පුද්ගලයන්ගෙන් අය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීමේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.3 ජේදය	13,506,764	V-8 වර්ගයේ ජීප් රථයකට සිදුවූ අලාභය අයකර ගැනිමට සහ ඒ සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් හෝ නියෝජ්‍ය ලේකම්වරයාගෙන් නියෝග ලබාගැනිමට 2025 ජනවාරි වන විටත් කටයුතු කර නොතිබුණි.	රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් මේ සම්බන්ධව උපදෙස් ලබාගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවත්නා බව සඳහන් කරමි.	වාහනයට සිදුවූ අලාභ ඊට වගකිවයුතු පුද්ලගයින්ගෙන් අයකර ගතයුතුය.

(ඇ)	2024 මැයි 29 දිනැති අංක 02/2024 දරන 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ සහ 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි විධිවිධාන සංශෝධනය කිරීමේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02(ආ) ඡේදය	1,817,070	ජීප් රථයකට සිදුවූ අනතුරින් රක්ෂණය විසින් ප්‍රතිපූර්ණය නොකරන ලද රු.1,817,070 ක අලාභය, වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	සිදු වූ අලාභයේ දළ අලාභය තක්සේරු කර අදාල ඉදිරි කටයුතු සිදුකරන බව සඳහන් කරමි.	වාහනයට සිදුවූ අලාභය වගකිවයුතු පුද්ලගයින්ගෙන් අයකර ගතයුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව යටතේ අමාත්‍යාංශය විසින් ඉටුකළ යුතු ප්‍රධාන කාර්යයන් යටතේ වතු ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන "ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන පිහිටුවීම" සඳහන් කර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව එම කාර්යය සැලසුම් කර ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි.	අමාත්‍යාංශයට 2024 වසරේදී වෙන් කරන වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණය අඩු වීම නිසා එය 2024 අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොකරන ලදි.	අමාත්‍යාංශ විෂය පථයට අයත් ප්‍රධාන කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන් කර ගත යුතුය.

4.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වතු ප්‍රජාවගේ දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපනය සහ සෞඛ්‍ය පහසුකම් තහවුරු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ රු.මිලියන 583.08 ක් වෙන්කර තිබුණු අතර ක්‍රියාකාරී	මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර, ප්‍රතිපාදන ලැබුණේ 2024.06.26 දින වේ. ඒ සමගම ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීමත් පාර්ලිමේන්තු මැතිවරණයද පැවැත්වූ බැවින් මැතිවරණ කොමිෂන් සභාව මඟින්	වතු ප්‍රජාවගේ දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපනය සහ සෞඛ්‍ය පහසුකම් තහවුරු කිරීම සඳහා සැලසුම් කල වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

	සැලැස්ම තුළ ඒ වෙනුවෙන් වැඩසටහන් 2 ක් යටතේ ව්‍යාපෘති 7 ක් සැලසුම් කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ ඉන් ව්‍යාපෘති 4 ක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 12.95 ක් එනම් සියයට 2.2 ක් පමණක් වැය කර තිබුණි.	ඉදිරිපත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව වැවිලි ප්‍රජාවගේ ජීවනෝපාය වැඩිදියුනු කිරීමේ වැඩසටහන් තාවකාලිකව නතර කල නිසා සැලසුම් කළ ඉලක්ක ලබා කරගැනීමට නොහැකි විය.	
(ආ)	වතු අංශයේ යටිතල පහසුකම් සංවර්ධන කිරීම වෙනුවෙන් වැවිලි අංශයේ සියලුම ප්‍රතිලාභීන් සඳහා දත්ත සමීක්ෂණයක් සිදු කිරීම සහ මාර්ග සංවර්ධනය යන කාර්යයන් වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 2 ක් සහ රු.මිලියන 5 ක් ලෙස වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල අදාල කාර්යයන් ඉටුකර නොතිබුණි.	- එම -	මෙම ප්‍රදේශ වල ජීවත්වන ජනතාව මුහුණදෙන දුෂ්කරතා හේතුවෙන් අත්‍යාවශ්‍ය වූ සංවර්ධන කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදන උපයෝගී කරගෙන අදාල කාර්යයන් කඩිනමින් නිම කළ යුතුය.
(ඇ)	ඉන්දියානු ආධාර මත නිවාස 4,000 වැඩසටහන යටතේ 2024 දෙසැම්බර් 31 දින වන විට නිවාස 3,972 ක් නිමකර පැවතියද ඉන් නිවාස 349 ක් ප්‍රතිලාභීන් වෙත භාරදී නොතිබුණි. එමෙන්ම ඒ යටතේ ඉදිකළ නිවාස 150 ක් සඳහා විදුලිය සහ ජලය ලබාදීම වෙනුවෙන් රු.මිලියන 25 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 16.75 ක් වැයකර සියළු නිවාස සඳහා විදුලිය ලබා දී තිබුණද නිවාස 100 ක් සඳහා ජල සැපයුම ලබාදී නොතිබුණි.	විවිධ ප්‍රායෝගික හේතු මත ප්‍රමාද වී ඇති ජල සැපයුම කඩිනමින් ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	මෙම ප්‍රතිපාදන අදාල අරමුණ කරා යොමුකර එම ජනතාවගේ අවශ්‍යතා කඩිනමින් ඉටු කිරීම කළමණාකරණයේ වගකීමක් බැවින් මෙම වැඩසටහන් සැලසුම් කළ පරිදි නිම කළ යුතුය.

4.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1950 අංක 09 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ පනත ප්‍රකාරව, ජල සම්පාදන ව්‍යාපෘති	පැවැති ආර්ථික අවපාතය හේතුවෙන් එම මූල්‍ය ප්‍රතිපාදන සැලසුම් කල පරිදි ලබගැනීමට	තවදුරටත් ප්‍රමාදයන් වලක්වා ඉදිකිරීම් කටයුතු සිදු කර ජනතාවට

	05 ක් සඳහා සහ බදුල්ල නාගරික අපජල හා මලාපවහන පද්ධතියේ පිරිපහදු ඒකකය ඉදිකිරීමට ලබාගත් ඉඩම් සඳහා 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අවස්ථා 11 කදි ඉඩම් අයිතිකරුවන්ට වන්දි මුදල් ගෙවා තිබුණි. එහෙත් එම ඉඩම්වල ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල ඉදිකිරීම් කටයුතු 2024 ජුනි 30 දින වන විටත් සිදුකර නොතිබුණි.	නොහැකි විය. එමනිසා මුදල් ප්‍රතිපාදන ලබා ගන්නා තෙක් ව්‍යාපෘතිය අතරමග තාවකාලිකව නවතා ඇත.	අපේක්ෂිත ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කල යුතුය.
(ආ)	ඉන්දියානු ආධාර මත ඉදිවන නිවාස 10,000 ව්‍යාපෘතිය යටතේ හැටන්, මහනුවර, නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්කවල 2024 දෙසැම්බර් 31 වන විට නිවාස 459 ක ඉදිකිරීම් විවිධ අදියරයන්වල පැවති අතර නිවාස 5 ක් පමණක් නිමකර තිබුණි. 2024 වර්ෂයේ නිවාස 200 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 3,600 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 496.69 ක් පමණක් එනම් සියයට 14 ක් විය. යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන්ද රු.මිලියන 300 ක ප්‍රතිපාදනයක් වෙන්කර පැවතියද 2024 දෙසැම්බර් 31 දින වන විට එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 65.40 ක් එනම් සියයට 22 ක් විය.	ක්‍රියාත්මක කිරීමේ ආයතන කැඳවා මෙම නිවාස ඉදිකිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත. වත්මන් භෞතික ප්‍රගතිය සියයට 33 කි. විදුලි සැපයුම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට ව්‍යාපෘති 22 කට රු.66,395,004.35 ක් ගෙවීම් කර ඇති අතර ව්‍යාපෘතිවලට නොපමාව විදුලි සැපයුම ලබාදීමටත්, ඇස්තමේන්තු ලබාදී නොමැති ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ලබාගැනීම සඳහාත් අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇත. ජල සැපයුම ලබාදීමේ ප්‍රමාදය පිළිබඳව වැවිලි මානව සංවර්ධන භාරයට උපදෙස් ලබාදී ඇත. ව්‍යාපෘති 21 ක් සඳහා ඇස්තමේන්තු අනුමත කර ඇත.	- එම -
(ඇ)	වතුකරයේ ප්‍රතිලාභී පවුල් 2000 ක් සඳහා ඉන්දියන් ආධාර යටතේ සහ රජයේ ප්‍රතිපාදන යටතේ ඉදිකරනු ලබන නිවාස සඳහා 2024 වර්ෂයේ නිරවුල් ඔප්පු ලබා දීමට රු.මිලියන 22.6 ක් වෙන්කර තිබුණද ඔප්පු 716 ක් පමණක් ලබා දී තිබුණු අතර ඔප්පු 1081 ක් සකස් කරමින් පැවතිණි.	ඔප්පු 77 ක් නිවාසවල පදිංචිය තහවුරු කරන තෙක් වැවිලි ප්‍රජාව සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය රඳවා ගෙන සිටින අතර ඔප්පු 281 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ලබා ගැනීමට නියමිතව ඇත. රු.මිලියන 22.6 න් රු.මිලියන 7.9 ක් මිනින්දෝරු සැලසුම් ඇඳීම සඳහා වියදම් කර ඇති අතර නිවාස 2006 කින් 1080 ක් සඳහා ඔප්පු සකස් කර තිබේ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන්	සුදුසු ක්‍රමවේදයක් මත ඔප්පු කඩිනමින් ලබා දීමට කටයුතු කළ යුතුය.

	සභාව අදාල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.	
(ඇ) වතු යටිතල පහසුකම් සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කර තිබූ නව ජීවන හා හරිත රන් නිවාස වැඩසටහන යටතේ 2017-2021 වර්ෂවලදී ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස ඒකක 629 ක් 2023 සහ 2024 වර්ෂ වලදී නිම කර තිබූ අතර වර්ෂ 2016-2021 කාලසීමාව තුළ ඉදිකිරීම් ආරම්භ කල නිවාස ඒකක 420 ක් 2025 වර්ෂයේදී ඉදිකිරීමට සැළසුම් කර තිබුණි. 2018-2021 කාලය තුළ ඉදිකිරීම් ආරම්භ කල නිවාස ඒකක 420 න් නිවාස ඒකක 397 ක් 2025 පෙබරවාරි 28 දින වනවිටත් අවසන් වී නොතිබුණි.	2022 වසරේ ශ්‍රී ලංකාවේ ඇතිවූ ආර්ථික අවපාතය හේතු කොටගෙන 2017 හා 2021 වසරවල BSR අගය අනුව කොන්ත්‍රාත් අවසන් කිරීමට නොහැකි විය. අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවාසවල ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2023 වර්ෂයේදී නිවාස ඒකක 300 කද 2024 වර්ෂයේදී නිවාස ඒකක 329 කද ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදි. 2025 වර්ෂයේ ලද රු.මිලියන 767 ක ප්‍රතිපාදනයෙන් නිවාස ඒකක 397 ක කටයුතු අවසන් කිරීමට නියමිතය.	මෙම නිවාස කඩිනමින් නිමකර අදාල හිමිකරුවන්ට භාර දිය යුතුය.

4.4 ප්‍රසම්පාදනයන්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ජල තාක්ෂණය සඳහා වූ චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ සහ ආදර්ශන මධ්‍යස්ථානය සඳහා ජාතික තරඟකාරි ලංසුකැඳවීම යටතේ සූර්ය පැනල පද්ධතියක්, සැපයීම, ස්ථාපිත කිරිම, පරික්ෂා කිරිම හා ක්‍රියාත්මක කිරිම ඇතුලු ප්‍රසම්පාදනය සඳහා රු.8,160,000 කට තෝරාගත් පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමෙහි ඉල්ලීම මත ලංසු ඉදිරිපත් කලයුතු දිනය දින 07 කින් දීර්ඝ කර තිබුණි. ඒ පිළිබඳ පුවත්පත් දැන්වීම් මගින් ප්‍රසිද්ධ කර නොතිබුණු බැවින් වැඩි ලංසුකරුවන් ප්‍රමාණයකට ලංසු ඉදිරිපත් කිරීමට තිබූ අවස්ථාව හා වැඩි තරඟකාරීත්වයකින් ලංසුකරුවෙකු තෝරාගැනිමේ අවස්ථාව මගහැරි තිබුණි. මෙම සූර්ය පැනල පද්ධතියට අදාළ ප්‍රමාණ පත්‍රවල Provisional Sum	කාලය දීර්ඝ කිරීම් පුවත්පත් දැන්වීමක් හරහා සිදු කළ යුතු බව පිළිගන්නා අතර ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදුනොවීමට වගබලා ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. ගෙවීම සඳහා ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද ලංසු වටිනාකමත් වරලත් ඉංජිනේරුවෙකු විසින් ලබා දෙන ලද සම්පූර්ණ කිරීමේ සහතිකය සහ විදුලි බල මණ්ඩල ගිවිසුම, සාක්ෂි ලෙස අදාල කර ගන්නා ලදී.	ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයෙන් සිදු නොකිරීම හේතුවෙන් යම් අක්‍රමිකතාවයක් සිදුවූයේද යන්න පරීක්ෂණයකට භාජනය කළ යුතුය. පිරිවැය ඇස්තමේන්තු වල ඇතුළත් වෙන් කිරීම්වලට (Provisional sums) අදාල ගෙවීම් සඳහා බිල්පත් මගින් තහවුරු විය යුතුය.

ලෙස වෙන්කර තිබුණු රු.466,560 ක වියදම බිල්පත් මගින් තහවුරු කරගැනීමකින් තොරවම මුළු මුදලම සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.		

4.5 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ජල තාක්ෂණය සඳහා වූ චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ සහ ආදර්ශන මධ්‍යස්ථානය වෙත චීන රජයේ ප්‍රදානයක් ලෙස 2020 වර්ෂයේදී ලැබී තිබූ රු.40,441,639 ක් වටිනා ජංගම ජල පරීක්ෂණ රථය ලැබී 2024 දෙසැම්බර් වන විට වර්ෂ 4 කට වඩා කාලයක් ගත වී තිබුණද 2024 සැප්තැම්බර් 30 දින වන විටත් කිසිදු ජල පරීක්ෂණ කටයුත්තක් සඳහා යොදා නොගෙන නඩත්තු පිරිවැය වශයෙන් රු.894,864 ක් වැයකර තිබුණි. ජල පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය සියළු උපකරණ හා පහසුකම්වලින් සමන්විත වූ මෙම රථය රු.7,000,000 ක් ලෙස තක්සේරුකර ඌණ රක්ෂණයක් සිදුකර තිබුණි.	චීන සැපයුම්කරු විසින් සපයන ලද ඉන්වොයිස් වටිනාකම මත පදනම්ව ජංගම ජල පරීක්ෂණ රථය සඳහා පමණක් රු.477,701.50 ක රක්ෂණාවරණයක් ලැබී ඇත. එම නිසා නැවත වරක් ජංගම ජල පරීක්ෂණ රථය පමණක් රු.7,000,000 කට තක්සේරු කර රක්ෂණාවරණය සිදුකර ඇත. රථයට වාහන අංකයක් ලබා දීමට මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දීර්ඝ කාලයක් ගත කිරීම නිසා ධාවනයට යෙදවීමට නොහැකිව තිබීමෙන් යම් මුදලක් නඩත්තු පිරිවැය වශයෙන් වැය කිරීමට සිදු විය.මෙම ජල පරීක්ෂණ රථය පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා ලබාදීමට කටයුතු සිදුකරමින් පවතී.	මෙම රථය ප්‍රයෝජනයට ගැනීම සඳහා ගනු ලබන තීරණ කඩිනමින් ක්‍රියාත්මක කර මෙම පරීක්ෂණ රථය විනාශ වීමෙන් වන හානිය වලක්වා ගත යුතුය.

4.6 කළමනාකරණ දුර්වලතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 හා 38(අ) වගන්තිය ප්‍රකාරව අත්පත් කරගන්නා ඉඩම් සඳහා 38 නියෝගය නිකුත්කර වන්දි මුදල් ගෙවන දිනය දක්වා ඉඩම් හිමියා වෙත පොලී මුදල් ගෙවිය යුතු වේ. එසේ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සම්පාදන	එක් එක් ආයතනය වෙතින් කාර්යයන් කරගැනීමේදී ගතවන කාල සීමාව මත වන්දි ගෙවීමේ කාලය තීරණය වේ. එබැවින් 38(අ) අතුරු වගන්තිය යටතේ භුක්තිය කඩිනමින් ලබා ගත්තද වන්දි මුදල් ගෙවීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වීම නොවැලැක්විය හැකිය.	ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කර රජයේ මුදල් පොලී වශයෙන් ගෙවීම අවම කර ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කර ගැනීමට කටයුතු කල යුතුය. නිළධාරීන්ගේ අකාර්යක්ෂමතාවය

	ව්‍යාපෘති සඳහා අත්පත්කර ගත් ඉඩම් වෙනුවෙන් වර්ෂ 2 කට හා වසර 5 කට පසු වන්දි මුදල් ගෙවීම නිසා පිළිවෙලින් රු.5,274,634 ක් හා රු.8,106,778 ක් පොලී වශයෙන් 2024 වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා පමණක් ගෙවා තිබුණි. ඊට අමතරව 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අවස්ථා 11 දී අත්පත් කර ගත් ඉඩම් සඳහා 2023 හා 2024 වර්ෂවලදී රු. 10,859,867 ක පොලී මුදලක් ගෙවා තිබුණි.		හේතුවෙන් රජයට සිදු වන පාඩු සඳහා අදාල නිලධාරීන් වගකිව යුතු බැවින් ඒ සම්බන්ධයෙන් විනය පියවර ගත යුතුය.
(ආ)	පෙර සිටි ජල සම්පාදන අමාත්‍යවරයාට හා රාජ්‍ය අමාත්‍යවරයාට අනුයුක්ත කර තිබූ වාහන 03 ක් 2023 හා 2024 වර්ෂයන් තුලදී අනතුරට ලක්වීමෙන් දළ වශයෙන් රජයට රු.70,323,834 ක පාඩුවක් සිදු වී තිබුණි. මුදල් රෙගුලාසි 156(i)(ආ) ප්‍රකාරව එම වාහන අනුයුක්ත කර තිබූ නිළධාරින් තම වගකීම නිසි පරිදි ඉටු කර තිබේද යන්න පිළිබඳව විධිමත් පරික්ෂණයක් සිදු කර රජයට සිදුවී ඇති අලාභ අයකර ගැනිමට සහ අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට අමාත්‍යාංශ නිළධාරීන් කටයුතු කර නොතිබුණි.	මෙම සියළු වාහන අනතුරුවලින් සිදුවූ අලාභය සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ උපදෙස් ලබාගෙන අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව සඳහන් කරමි.	නිළධාරීන්ගේ නොසැලකිල්ල මත පාඩු පියවා ගැනීමට නොහැකි වීම රජයට වැය බරක් නොවිය යුතු බැවින් වගකිව යුතු පුද්ලයන්ගෙන් අලාභය අයකර ගත යුතුය.
(ඇ)	අළුත්වැඩියා සඳහා යොමුකල වාහන 04 ක් 2024 දෙසැම්බර් 01 වන විට මාස 06 ත් මාස 10 ත් අතර කාලයක් ගතවී තිබුණද අළුත්වැඩියා කර නැවත බාර දී නොතිබුණි. ඒ පිලිබද අමාත්‍යාංශ නිලධාරීන් විසින් නිසි අධීක්ෂණයක් සිදුකර නොතිබූ අතර එම වාහන අවභාවිතයට, විනාශවීමට හා දිරාපත් වීමට ඉඩ සලසා තිබුණි.	වාහන අලුත්වැඩියාවට යොමු කිරීමේදී නිශ්චිත කාලසීමාවක් තුළ සිදු කරන මෙන් විශේෂයෙන් සඳහන් කර යොමු කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.	කෙටි කාලයක් තුල නිසි පරිදි වාහන අළුත්වැඩියා කරවා ගත යුතුය. රජයේ දේපල අවභාවිතයට, විනාශවීමට හා දිරාපත් වීමට ඉඩ හැරීම සම්බන්ධයෙන් නිලධාරින් වගකිවයුතු බැවින් ඒ පිළිබඳව විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඇ)	‘ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම සහ ජල සම්පාදන ක්‍රියාවලිය’ ආශ්‍රිත වීඩියෝ දර්ශන 6 ක් සැකසීම සඳහා රු.1,200,000ක් පුද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. මෙම වීඩියෝ දර්ශන 06 විනාඩි 15 තත්පර 26 ක කාලයක් අඩුවෙන් නිර්මාණය කර තිබුණු බැවින් රජයට රු.617,333 ක පාඩුවක් සිදුවී තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව අදාල නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වෙන අතර ඊට අදාළ ඉදිරි කටයුතු සිදු කර විගණනය වෙත වාර්තා කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	නිලධාරින්ගේ නොසැලකිලිමත් කමින් හෝ හිතාමතාම සිදු කරන වැරදි හේතුවෙන් රජයට සිදු වන පාඩු සඳහා අදාල නිලධාරින් වගකිව යුතුය.
(ඉ)	අමාත්‍යාංශය මගින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ජල ව්‍යාපෘති සම්බන්ධ කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් මුදල් ලබාදී තිබුණද කොන්ත්‍රාත් කාර්යයන් නිම නොකිරීම හෝ වැඩ අතරමඟ නවතා දැමීම හේතුවෙන් ගෙවා තිබූ එකතුව රු.1,843,755,280 ක අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමට 2025 මාර්තු වන විටත් කටයුතු කර නොතිබුණි.	එම කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවන ලද අත්තිකාරම් ආපසු අයකර ගැනිම හෝ නැවත කොන්ත්‍රාත් ආරම්භකිරීම පිළිබඳ සාකච්ඡා වට කිහිපයක් 2024 වර්ෂය තුළදි ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර ඒ අනුව මද වශයෙන් අයකිරීම් ප්‍රමාණයක් සිදුවේ.	රජයේ මුදල් නොසැලකිලිමත් ලෙස හා කිසිදු ප්‍රතිලාභයක් නොලබා තුන්වන පාර්ශවයකට දීර්ඝ කාලයක් තබා ගැනීමට ඉඩහැරීම පිළිබඳව අදාල නිලධාරින් වගකිව යුතුය. එබැවින් ඊට අදාළ විධිමත් පරීක්ෂණයක් පවත්වා විනය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඊ)	වතු යටිතල පහසුකම් සංවර්ධන අංශය විසින් රජයේ ප්‍රතිපාදන යටතේ ඉදිකරන ලද නිවාසවලට අදාළව නිවාස ඉදිකිරීමට දරන ලද පිරිවැයෙන් සියයට 50 ක මුදලක් සියයට 4 ක පොලී අනුපාතයක් යටතේ ප්‍රතිලාභීන් වෙත ණයක් ලෙස ලබා දී තිබුණි. 2024 දෙසැම්බර් 31 වනවිට නිවාස ඒකක 4925 කට අදාළව රු. මිලියන 2,490 ක් අයවිය යුතුව පැවති අතර ඒතුල නිවාස ඒකක 4,823 ක් සඳහා ප්‍රතිලාභීන්ගෙන් කිසිදු මුදලක් අය නොවූ ණය ශේෂය රු.මිලියන 2,417 ක් විය. 2023 සහ 2024 වර්ෂවල	නිවාස ණය අයකරගැනීම සිදුකරනු ලබන්නේ ණය හා ප්‍රදාන පදනම මත ඉදිකර ප්‍රතිලාභීන් වෙත භාර දී ඇති නිවාස ඒකක සඳහා පමණි. එම තත්ත්වය නිශ්චිතවම තහවුරු කර ගැනීම සඳහා වැවිලි මානව සංවර්ධන භාරය වෙතින් තොරතුරු කැඳවා ඇත. 2022 වර්ෂයේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඇති වූ මිල උච්චාශාවචනයත් සමග 2020 සහ 2021 වර්ෂයන්වල ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවසක වටිනාකම රු.2,880,000 ක් හා රු.3,150,000 ලෙස වැඩි වී ඇත. ඒ අනුව එම නිවාස සඳහා අයකරනු ලබන නිවාස ණය මුදල්ද වසර 15-20 කාලයක් තුළ දී අයකර ගැනීමට	මෙම ණය මුදල් සහනදායි පදනමකට හෝ නැවත අයකර ගැනීම සිදු කල යුතුය.

	සම්පූර්ණයෙන් නිමකරන ලද නිවාස 629 ට අදාළව ප්‍රතිලාභීන්ගෙන් අයවිය යුතු මුදල් 2025 පෙබරවාරි 28 දින වනවිටත් හඳුනාගෙන නොතිබුණි.	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. අඩු වැටුප් සහිත දෛනික වේතන ලබන වතු ප්‍රජාවට දුන් නිවාස ණය අයකිරීමට සහනයන් ලබා දීම සඳහා අනුමැතිය ලබාගැනීමට අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමට අපේක්ෂිතය.	
(උ)	වතු ප්‍රජාව වෙනුවෙන් නිවාස ලබාදීම සඳහා 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රජයේ ප්‍රතිපාදන සහ ඉන්දියානු ආධාර යටතේ පිළිවෙලින් නිවාස 5,891 ක් සහ 3,980 ක් රත්නපුර, බදුල්ල, කෑගල්ල, මහනුවර, කලුතර, නුවරඑළිය සහ ගාල්ල යන කලාපවල නිමකර තිබුණු අතර ඉන් නිවාස ප්‍රතිලාභීන් 1,038 ක් සහ 659 ක් සඳහා පමණක් 2024 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් හිමිකම් ඔප්පු ලබා දී තිබුණි. ඒ අනුව ඔප්පු ලබාදීමේ ප්‍රගතිය රජයේ ප්‍රතිපාදන යටතේ සියයට 17.62 ක් සහ ඉන්දියානු ආධාර යටතේ සියයට 16.55 ක් විය.	ඉන්දියානු ආධාර යටතේ ඉදි කර ඇති නිවාස සඳහා පවතින නඩු කටයුතු අවසන් නොවීම, ප්‍රතිලාභීන් වෙත නිවාස ලබා දී තිබුණ ද ඔප්පු ලබා දීමේ දී අදාළ වන කොන්දේසි සපුරා නොතිබීම හේතුවෙන් හා මුල් ප්‍රතිලාභියා මියගොස් ඇති අවස්ථාවන් වලදීද ඔප්පු ලබා දී නොමැත.	වැඩසටහන් සැළසුම් කළ පරිදි කඩිනමින් නිම කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.
(ඌ)	ඉන්දියානු නිවාස 4000 වැඩසටහන යටතේ නුවරඑළිය, මාතලේ, නුවර හා බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි ඉදිකරන ලද නිවාස 655 ක් සඳහා 2024 නොවැම්බර් 26 දින වන විටත් ඉඩම් හිමිකම් ඔප්පු ලබාදී නොතිබුණි.	මෙම ඔප්පු ලබා දීමේ විවිධ ප්‍රායෝගික ගැටලු මතු වීම නිසා ඉඩම් හා නිවාස ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා මෙම අධිකාරිය මඟින් මූලික පියවරයන් ආරම්භ කර ඇත.	ප්‍රතිලාභීන් වෙත ඔප්පු ලබාදීමේ කටයුතු කඩිනම්ව සිදු කල යුතුය.
(එ)	නව ජීවන සහ හරිත රන් නිවාස වැඩසටහන් යටතේ 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලසීමාව තුළ නිවාස ඒකක 5262 ක් සාදා නිම කර තිබූ අතර එයින් නිවාස ඒකක 1722 ක් ප්‍රතිලාභීන් වෙත පවරාදී තිබේද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.	ප්‍රතිලාභීන් වෙත යතුරු භාර දුන් තොරතුරු වැවිලි මානව සංවර්ධන භාරය වෙතින් ලද පසු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසට අදාල නිලධාරි දැනුවත් කරන ලදි.	නිමකර ඇති නිවාස ප්‍රතිලාභීන් වෙත පැවරිමට කටයුතු කල යුතු අතර ඒ පිළිබඳ නිවැරදි හා යාවත්කාලීන වූ තොරතුරු පවත්වාගෙන යා යුතු ය.

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන අරමුණු 04 යටතේ සැමට සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම යන අරමුණු පෙරදැරිව නුවරඑළිය, මහනුවර හා බදුල්ල යන දිස්ත්‍රික්කවල වතු ප්‍රජාව වෙනුවෙන් සුහුරු පන්ති කාමර ස්ථාපිත කිරීම සඳහා 2023 වර්ෂයේදී රු.මිලියන 135 ක්ද 2024 වර්ෂයේදී ඉන්දීය ආධාර යටතේ උපකරණ සැපයීම වෙනුවෙන් රු.මිලියන 300 ක් සහ පන්ති කාමර අළුත්වැඩියා වෙනුවෙන් රජයේ ප්‍රතිපාදන රු.මිලියන 10 ක් වෙන්කර තිබුණද 2024 දෙසැම්බර් 31 දක්වා ඊට අදාළ කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි.	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ කෙටුම්පත් කරන ලද අවබෝධතා ගිවිසුම අවස්ථා කිහිපයකදී සංශෝධනය කරන ලදි. 2023 වර්ෂය සඳහා රු.මිලියන 135 ක් වෙන්කර තිබුණද අවබෝධතා ගිවිසුම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2024.12.30 දින ලබා දී ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතියට අදාල අවබෝධතා ගිවිසුම 2025.01.16 දින ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ අත්සන් කරන ලද අතර ව්‍යාපෘතියට අදාල කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී.	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදි මූලික කටයුතු කඩිනමින් ඉටුකර වාර්ෂික ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කර අදාළ අරමුණු ඉටු කළ යුතුය.